1. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම අවුරුදු දෙදහසකට වැඩි කාලයක් තුළ වර්ධනය වූවකි. ඒ අනුව
   1. දේශපාලනය හැදෑරීමට යොමු වූයේ කිනම් සියවසේ දී ද ?
   2. ඊට පුරෝගාමී වූ දේශපාලන දාර්ශනිකයින් දෙදෙනා නම් කරන්න.
   3. දේශාපාලනය හැදෑරීම මුලින්ම ම සිදු වූයේ කුමන යුගයක කවර නගරයක් කේන්ද්‍ර කරගෙන ද
2. ''දේශපාලන විද්‍යාව හැදෑරීම'' යන අදහස තුළ අර්ථ කිහිපයක් හඳුන්වා දෙන්න.
3. දේශපාලන විද්‍යාව යන්න කුමක් දැයි හඳුනා ගැනීමේ දී වැදගත්වන මූලික කාරණා කිහිපයක් දක්වන්න.
4. ''දේශපාලන විද්‍යාව යනු දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හදාරණ ශික්ෂණය වේ'' මෙම ප්‍රකාශනයේ වැදගත් තේමා දෙකක් අන්තර්ගත වේ. එම තේමා දෙක හඳුන්වන්න.
5. ''දේශපාලනය'' යන වචනයට පොදුවේ ලැබෙන වඩාත් ම සරල අර්ථකථනය වන්නේ.
6. දේශපාලන යන පදය තුළ ශාස්ත්‍රිය වශයෙන් ඉතා ගැඹුරු අදහසක් ගැබ් වී තිබේ. ඒ අනුව දේශාපලනය ප්‍රධාන අර්ථ දෙකකින් යුක්ත වේ. එම අර්ථ දෙක වන්නේ,
7. ග්‍රීක පොලිටිකෝස් යන්නෙහි අර්ථය වන්නේ ''පෞර රාජ්‍යයට අයත්'' යන අදහසයි. ඒ මගින් දේශපාන විද්‍යාව යන්නෙන් අදහස් වූයේ පෞර රාජ්‍යට සම්බන්ධ විෂය කාරණා අධ්‍යනය කරන විෂය ක්ෂේත්‍රය යන්නයි. පෞර රාජ්‍යය සම්බන්ධ විෂය කාරණා පුළුල් තේමා කිහිපයක් ඔස්සේ පැතිර ගොස් තිබේ. ඉන් තේමා කිහිපයක් හඳුන්වා දෙන්න.
8. ''දේශපාලනය'' සමාජයේ පුරවැසියන් අතර පවතින භාවිතයකි.'' මේ සඳහා දිය හැකි උදාහරණ කිහිපයක් දක්වන්න.
9. ''දේශපාලනය කරන පුරවැසියා '' සහ '' දේශපාලන හදාරන්නා'' අතර වෙනස දක්වන්න.
10. දේශපාලනය ශාස්ත්‍රීයව අධ්‍යනය කිරමේ දී දේශපාලන විද්‍යාව අදාළ වන තේමා රාශියක් එයට විෂය වස්තූන් වී ඇත. ඉන් තේමා පහක් හඳුන්වා දෙන්න.
11. ''දේශපාලනය කිරීම'' යන පුද්ගලයන් දේශපාලනික වශයෙන් කරන ක්‍රියාකාරකම් වේ. එසේ පුද්ගලයන් විසින් කරන ක්‍රියාකාරකම් උදාහරණ පහක් දක්වන්න.
12. දේශපාලන ශාස්ත්‍රීය අධ්‍යයනයට ලක් කිරීමේ දී දේශපාලනය යන පොදු ප්‍රපංචයේ පැතිකඩවල් හඳුනාගත හැකි ය. එයින් පැතිකඩ තුනක් දක්වන්න.
13. ඕනෑම සමාජයක දේශපාලනය ආයතන ගත ව පවතී, එසේ ආයතන ගතවී තිබෙන දේශපාලනයේ ප්‍රධාන ප්‍රකාශයන් පහක් දක්වන්න.
14. සෑම දේශපාලන ආයතනයක්ම ගොඩනැගී තිබෙන්නේ දේශපාලන භාවිතයන් පදනම් කරගෙන ය. ඒ අනුව පාර්ලිමේන්තු ආයතනයක පැවැත්ම සඳහා හැඩ ගැසුණු භාවිතයන් පහක් හඳුන්වන්න.
15. ආණ්ඩුකරණ ක්‍රියාවලියට අන්තර්ගත වන කාර්යයන් හතරක් දක්වන්න.
16. දේශපාලන චර්යාව යනු පුරවැසි දේශපාලන රුචි, අරුචිකම් සහ ක්‍රියාකාරකම් විස්තර කරන දේශපාලන සංකල්පය වේ. ඒ අනුව පුරවැසියන්ට නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල ඉටුකළ හැකි වැදගත් කාර්යයන් පහක් හඳුන්වා දෙන්න.
17. සමාජයක දේශපාලන ආයතන, භාවිත හා පුරවැසි දේශපාලනය, දේශපාලන සංසිද්ධි සහ රාජ්‍ය ප්‍රතිපත්ති හැඩ ගැස්වීම කෙරෙහි දේශපාලන මතවාද බෙහෙවින් වැදගත් වේ. එයින් වැදගත් වන දේශපාලන මතවාද පහක් නම් කරන්න.

18. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා අධ්‍යයන ප්‍රවේශ හයක් නම් කරන්න.
19. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය වර්ධනය කළ ප්‍රධාන දේශපාලන චින්තකයින් ධාරා තුනක් ඔස්සේ හඳුනා ගත හැක.ඒ ඔස්සේ මෙම අධ්‍යයන ප්‍රවේශ ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් හඳුන්වා දෙන්න.
20. දර්ශණවාදී ප්‍රවේශයේ මූලික ලක්ෂණ තුන හඳුන්වා දෙන්න.
21. තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයෙහි ඇති වැදගත්කම දක්වා එය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.
22. දේශපාලන විද්‍යාව කෙරෙහි බහු විෂයික ප්‍රවේශ මගින් අවධාරණය කරන්නේ බාහිර ශික්ෂණයන්ගේ න්‍යාය , සංකල්ප හා විධික්‍රම දේශපාලන විද්‍යාවට ද යොදා ගත හැකි බවය. ඒ අනුව පහත සඳහන් යුගලවල දී දේශපාන විද්‍යාව සමග සම්බන්ධ වූ ශික්ෂණයන් දක්වන්න.
    1. ග්‍රීක යුගය
    2. රෝම යුගය
    3. 19 වන සියවස
    4. 20 වන සියවස
23. විසිවැනි සියවසේ දී දේශපාලන විද්‍යාවට විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය එක්වීමත් සමග දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම නව ප්‍රවේශයක් ඔස්සේ ගමන් කරන ලදී, ඒ අනුව විද්‍යාත්මක ප්‍රවේශය මගින් ඉදිරිපත් වූ ප්‍රධාන මූලධර්ම තුනක් හඳුන්වා දෙන්න.
24. චර්යාවාදි අධ්‍යයනයේ මෑත කාලීන ප්‍රවණතා හතරක් දක්වන්න.
25. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය යන සංකල්පය මුලින් ම භාවිත වූයේ 18 වන සියවසේ යුරෝපීය චින්තකයන් අතරය. එහි ප්‍රධාන චින්තකයින් හතරදෙනා නම් කරන්න.
26. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයෙහි සම්ප්‍රදායික මුහුණුවර වෙනස් කළ
    1. දේශපාලන චින්තකයා කවුද ?
    2. ඔහු ඉදිරිපත් කළ න්‍යායික ප්‍රවේශය හැඳින්වූයේ කවර නමින් ද ?
    3. එම න්‍යායික ප්‍රවේශයේ ප්‍රධාන න්‍යායික අංගෝපාංග මොනවාද ?
27. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය ඔස්සේ මාක්ස්වාදී ආභාෂය ලැබූ දේශපාලන චින්තකයන් ඉදිරිපත් කළ විකල්ප දේශපාලන විද්‍යා ප්‍රවේශයේ මූලික ලක්‍ෂණ මොනවා ද ?
28. 1. දේශපාලන විද්‍යාව තුළ 'ස්ත්‍රීවාදය' ප්‍රධාන ශාස්ත්‍රීය ධාරාවක් බවට පත්වීමට බලපෑ හේතු දෙකක් දක්වන්න.
    2. ස්ත්‍රීවාදය විසින් දේශපාලන සහ සමාජ විග්‍රහයට එකතු කරන ලද නව සංකල්ප මෙනවා ද?
29. දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ප්‍රධාන ක්‍ෂේත්‍ර හතර හඳුන්වා දෙන්න.
30. දේශපාලන දර්ශනවාදය ප්‍රධාන තේමා තුනක් පිළිබඳ ව අවධානය යොමු කරයි. එම තේමා තුන උදාහරණ සහිත ව දක්වන්න.

31. සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට වර්තමානය දක්වා දේශපාලන දර්ශනවාදීන් උනන්දුව දක්වා ඇති ප්‍රධාන තේමා කිහිපයක් පහත දැක්වේ. එම තේමාවන් පිළිබඳව උනන්දුවක් දැක්වූ
    1. සම්භාව්‍ය/මධ්‍යකාලීන හා මුල් නූතන දේශපාලන දාර්ශනිකයින් සහ
    2. සමකාලීන දේශපාලන දාර්ශනිකයින් නම් කරන්න.

තේමාවන්

1. යුක්තිය/ සාධාරණත්වය
2. සමානාත්මතාවය
3. අයිතිවාසිකම්
4. නිදහස
5. දේශපාලනයේ ස්වභාවය
6. රාජ්‍යයේ ස්වභාවය

32. 20 වැනි සියවසේ මැද භාගය තුළ යම් පසුබැසීමකට ලක් වූ යුරෝපයේ දේශපාලන දර්ශනවාදය 1970 දශකයේ දී නැවත කීර්තිමත් ලෙස ඉදිරියට ඒම දැකගත හැකි වේ. ඒ අනුව.
 1. යුරෝපයේ දර්ශනවාදය පසුබෑමකට ලක් වූ හේතුව කුමක් ද ?
 2. එය යළිත් ඉදිරියට ඒමට සහ නැති වූ කීර්තිය නැවත ලැබෙන්නට බලපෑ හේතුව සඳහන් කරන්න.

33. ලෝක දේශපාලනයට විශාල කාර්යභාරයක් ඉටු කළ ප්‍රධාන දේශපාලන මතවාද නම් කරන්න.

34. ''දේශපාලන මතවාදයක්'' යන්න අර්ථකථනය කරන්න.

35. දේශපාලන මතවාදයක දැකිය හැකි ගුණාංග හතරක් දක්වන්න.

36. දේශපාලන මතවාදයක් ලෙස ලිබරල්වාදය තුළ දැකිය හැකි
 1. මූල ධර්ම දක්වන්න.
 2. ලිබරල්වාදය තුළින් වර්ධනය වූ දේශපාලන ආයතන හඳුන්වන්න.
 3. ලිබරල්වාදයේ ප්‍රධාන භාවිතයන් හඳුන්වා දෙන්න.
 4. ''ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය'' බිහි වූයේ කුමන හේතු සාධක පදනම් කරගෙන ද ?

37. 19 වන සියවසෙන් පටන්ගෙන 20 වන සියවසේ ප්‍රබල දේශපාලන මතවාදයක් බවට පත් වූ සමාජවාදය විවේචනයට ලක්වන්නේ කුමන දේශපාලන සහ කවර ආර්ථික ක්‍රමය ද ?

38. සමාජවාදය යන්න ඉදිරිපත් වන්නේ කුමන දේශපාලන මතවාදය මගින් ද ?

39. සමාජවාදය ඇති කළ හැක්කේ කෙසෙද යන්න මාක්ස්වාදීන් ඉදිරිපත් කරන තර්කය වන්නේ කුමක්ද?

40. 20 වැනි සියවසේ දේශපාලනයෙහිලා සමාජවාදය මගින් ඉටු කළ ප්‍රධාන කාර්යයන් හතරක් දක්වන්න.

41. ජාතිකවාදය විකාශනය වූ ආකාරය දක්වන්න.

42. දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදය මගින් ඉටුකර ඇති සහ තවත් ඉටු කරන කාර්යයන් මොනාව ද ?

43. න්‍යායක් යනු කුමක් දැයි හඳුන්වන්න.

44. නූතන දේශපාලන සහ සමාජ චින්තනය තුළ න්‍යාය යන සංකල්පය භාවිතා කරන්නේ කවර හේතුවකට ද ?

45. ''න්‍යාය '' යන සංකල්ප විග්‍රහ කිරීම සඳහා භෞතික විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ දේශපාලන විද්‍යාව සඳහා දිය හැකි වඩා ගැළපෙන උදාහරණ තුනක් දක්වන්න.

46. දේශපාලන විද්‍යාවේ න්‍යාය යන සංකල්පයට අර්ථ දෙකක් ඇතුළත් වේ. එම අර්ථ දෙක දක්වන්න.

47. විසිවන සියවසේ සමකාලීන පවතින දේශපාලන විද්‍යාව තුළ න්‍යායික ක්ෂේත්‍ර, ප්‍රවේශ සහ මතධාර ගණනාවක් හඳුනාගත හැකි. එම න්‍යායික මතධාර 5 ක් දක්වන්න.

48. සමාජයේ පවත්නා ආයතන විධිමත් සහ අවිධිමත් වශයෙන් වර්ගීකරණය කළ හැකි ය.

1. විධිමත් සහ අවිධිමත් අයතන අතර වෙනස දක්වන්න.
2. විධිමත් සහ අවිධිමත් ආයතනවලට උදාහරණ සපයන්න.

49. දේශපාලන අධ්‍යයනයට අදාළ වන ප්‍රධාන පෙළේ ආයතන හතරක් හඳුන්වා දෙන්න.

50. දේශපාලන ආයතන වශයෙන් රාජ්‍ය සහ ආණ්ඩුව එකිනෙක සම්බන් වූවත් ඒ දෙක එකක් ම නොවේ. එසේ නම් රාජ්‍ය සහ ආණ්ඩු අතර පවතින වෙනස්කම් දක්වන්න.

51. දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් පහත ඉදිරිපත් කර ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
1. වැදගත් දේශපාලන ආයතන ලෙසට යුරෝපයේ ඇමෙරිකාවේ දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරු වූයේ 20 වන සියවස ආරම්භයේ දී ය. එම පසුබිම තුළ දේශපාලන පක්ෂ වර්ධනය වීමට බලපෑ හේතු දෙකක් දක්වන්න.
2. දේශපාලන පක්ෂයක් යන්න අර්ථ දක්වන්න.
3. දේශපාලන පක්ෂ වර්ගීකරණය දක්වන්න.
4. දේශපාලන පක්ෂ ක්‍රම හඳුන්වන්න.
5. දේශපාලන පක්ෂවල කාර්යයන් පහක් දක්වන්න.

52. අභිලාෂ කණ්ඩායම්

53. ලොබි කණ්ඩායම්

54. බලපෑම් කණ්ඩායම් යන පද තුනෙහි වචනාර්ථය දක්වන්න.

55. 1. බලපෑම් සහ අභිලාෂ කණ්ඩායම් වැනි විධිමත් සංවිධාන තිබෙන අතර ලංකාවේ ද ඒවා සමිති සමාගම් ලෙස පිහිටුවා ගෙන ඇත. මෙම සංවිධාන විධිමත් ලෙස හඳුන්වා දීමට හේතු දක්වන්න.
2. ලංකාවෙන් මෙම සංවිධානවලට දිය හැකි නිදසුන් හතරක් දක්වන්න.

56. දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම් අතර තම අරමුණු දිනා ගැනිමට ක්‍රියා කිරීමේ දී දැකි ය හැකි ප්‍රධාන වෙනස්කමක් දක්වන්න.

57. සිවිල් සමාජය යන්න අර්ථ දක්වන්න.

58. දේශපාලන හා සමාජ න්‍යායේ සිවිල් සමාජය යන්නට ඇති සංකල්පීය ඉතිහාසය තුළ එය අර්ථ හතරකින් භාවිතා කරනු ලැබේ . එම අර්ථ හතරක් දක්වන්න.

59. රාජ්‍යයේ කාර්යයන් සම්ප්‍රදායික ව තේරුම් ගෙන ඇත්තේ ප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර තුනක් ආශ්‍රය කර ගෙනය. එම කාර්ය ක්ෂේත්‍ර තුන දක්වන්න.

60. සමකාලීන ලෝකයේ රාජ්‍ය වල කාර්යභාරය කුමක් ද යන්න දක්වන්න.

61. ''රාජ්‍ය මනුෂ්‍ය සංවිධායන/සමාගම් අතර ඉහළම සංවිධානය වන්නේ ය.'' යන ප්‍රකාශයට අර්ථ දෙකක් ඉදිරිපත් වී ඇත. එම අර්ථ දෙක දක්වන්න.

62. නූතන භෞමික රාජ්‍ය සංවිධානය වි ඇති ප්‍රධාන අංග හතර දක්වන්න.

63. නූතන භෞමික රාජ්‍ය සංවිධානගත වී තිබෙන ප්‍රධාන අංග හතර පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
1. නිශ්චිත දේශ සීමාව.
2. ජාතිය පදනම
3. ආණ්ඩුව

4. ස්වාධිපත්‍යය

64. නූතන ජාතික රාජ්‍යයේ මූලික ඇඟයීම් සහ වර්තමානයේ ජාතික රාජ්‍ය තුළ අර්ථ කථනය දක්වන්න.

65. බහුත්වවාදය ගොඩනැගීමට හේතුදක්වන්න.

66. ගෝලීයකරණය සම්බන්ධයෙන් මතු වූ අදහසක් වන්නේ ජාතික රාජ්‍ය දුර්වල වීමට ගෝලීයකරණය හේතු වී ඇති බව ය. ඒ පිළිබඳ න්‍යායික ප්‍රවේශ දෙකක් මතුවිය. ඒවා හඳුන්වන්න.

67. රාජ්‍ය මාදිලි වර්ගීකරණයට අයත් වන ප්‍රධාන රාජ්‍ය මාදිලි නම් කරන්න.

68. පහත සඳහන් වගුව තුළ ගෝත්‍රික රාජ්‍ය, ග්‍රීක නාගරික (පෞර) රාජ්‍ය සහ රාජාණ්ඩු යන රාජ්‍ය මාදිලිවල ලක්ෂණ වගුගත කරන්න.

69. රාජ්‍ය මාදිලියක් ලෙස ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයෙහි තත්ත්වය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

70. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක විම සඳහා අවශ්‍ය මූලික සමාජ, දේශපාලන විචල්‍යයන් හඳුන්වා දෙන්න.

71. සමාජවාදි රාජ්‍ය මාදිලිය සහ ෆැසිස්ට්වාදි රාජ්‍ය මාදිලිය අතර පවතින වෙනස්කම් පෙන්වා දෙන්න.

72. ''යටත් විජිත රාජ්‍ය '' යන්න අර්ථ දක්වන්න.

73. ලංකාවේ යටත් විජිත රාජ්‍යයේ විකාෂනය සිදු වූයේ කෙසේ ද ?

74. පූර්ව යටත් විජිත රාජ්‍යවල පැවති රාජ්‍ය මාදිලි වර්ග නම් කරන්න.

75. යටත් විජිත සමාජයන්හි දේශපාලන ක්‍රමවල සිදු වූ වෙනස්කම් කිහිපයක් දක්වන්න.

76. 1. පශ්චාත් යටත් විජිත රාජ්‍ය මාදිලිය ලෙස න්‍යායික තර්කයක් ඉදිරිපත් කළ න්‍යායවේදීයා නම් කරන්න.
    2. ඔහු සිය තර්කය ඉදිරිපත් කළ සඟරාව සහ එහි ඇතුළත් රචනාව නම් කරන්න.

77. පශ්චාත් යටත් විජිත රාජ්‍යවල විශේෂ ලක්ෂණ 4 ක් දක්වන්න.

78. නව ලිබර්වාදි රාජ්‍ය ක්‍රමය බිහිවීමට බලපෑ හේතු කිහිපයක් ඉදිරිපත් කරන්න.

79. 1 .ස්වාධිපත්‍යය බලය යන්න අර්ථ දක්වන්න.
    2. ස්වාධිපත්‍යය යන පදය පළමුවරට දේහපාලන විද්‍යාව තුළ භාවිතයට ගත් චින්තකයා නම් කරන්න.
    3. ඔහු ස්වාධිපත්‍යය යන්න අර්ථ කථනය කළේ කෙසේ ද ?
    4. අභ්‍යන්තර ස්වාධිපත්‍යය යන්න හඳුන්වා දෙන්න.
    5. බාහිර ස්වාධිපත්‍යය යන්න හඳුන්වා දෙන්න.

80. ස්වාධිපත්‍යය බලයට පවතින අභියෝග මොනවා ද ?

81. පුරවැසියා යන පදයට අර්ථ කිහිපයක් තබේ. ඒවා හඳුන්වන්න.

82. රාජ්‍යයට පුරවැසියා අවනත භාවය දැක්විය යුත්තේ මන් ද ? යන ප්‍රශ්නයට දේශපාලන චින්තකයින් විවිධ පිළිතුරු පවසා ඇත. ඒ අනුව ඉදිරිපත්ව ඇති අදහස් මොනවා ද ?

83. රාජ්‍ය සහ ආණ්ඩු වෙතින් ප්‍රභවය ලබන සමාජයේ පවතින දේශපාලන ආයතනවලට උදාහරණ කිහිපයක් සපයන්න.

84. ප්‍රජාතන්ත්‍රවාදි දේශපාලන ක්‍රමවල
    1. රාජ්‍ය යන්න හඳුන්වා දෙන්න.
    2. ආණ්ඩුව යන්න හඳුන්වා දෙන්න.

85. පාලන තන්ත්‍රය (Regime) යන සංකල්පයට යම් වෙනස් අර්ථයක් ලබා දියහැකිය. එය අර්ථ ගන්වන්න.
86. රාජ්‍යයේ ස්වභාවය සම්බන්ධයෙන්සමාජ සම්මුතිවාදීන් ඉදිරිපත්කළ අදහස් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
87. රාජ්‍ය පිළිබඳව ස්ත්‍රීවාදීන් දරණ අදහස වන්නේ කුමක් ද ?
88. දේශපාලන ශාස්ත්‍රීය ලෙස හැදෑරීමට පුරෝගාමී වූ ග්‍රීක දේශපාලන චින්තකයින් දෙදෙනා නම් කරන්න.
89. ''දේශපාලනය' යනු පෞර රාජ්‍යයට සම්බන්ධ කාරණයක්ය යන ග්‍රීක අදහස තුළ අර්ථ දෙකක් දක්නට ලැබේ. එම අර්ථ දෙක හඳුන්වන්න.
90. දේශපාලන සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය තුළ ප්‍රධාන පැති දෙකක් හඳුනා ගත හැක. එම පැත දෙක දක්වන්න.
91. පුරාතන ඉන්දියාවේ සහ චීනයේ 'දේශපාලනය' පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ප්‍රධාන චින්තකයන් දෙදෙනා නම් කරන්න.
92. ''දේශපාලන කිරීම'' යන්නෙන් අර්ථ දැක්වෙන අදහස් දෙකක් ලියන්න.
93. ''දේශපාලනය හැදෑරීම යන අදහස තුළ අර්ථ දෙකක් ගැබ් වී පවති. එම අර්ථ දෙක දක්වන්න.
94. දේශපාලන ව්‍යවහාරික ඥානයන් ලෙස ලබන අවබෝධය ක්‍රමානුකූලව ලබා ගන්නා දැනුමක් නොවේ. එම දැනුම ලබා ගන්න ප්‍රබල කාරකයන් දෙකක් දක්වන්න.
95. දේශපාලන විද්‍යා ශික්ෂණය විසින් හදාරනු ලබන ප්‍රධාන දේශපාලන පැතිකඩ දෙකක් දක්වන්න.
96. ආණ්ඩුකරණ ක්‍රියාවලියට අන්තර්ගත වූ කාර්යයන් දෙකක් ලියන්න.
97. පුරවැසියන් විසින් නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල කරන කාර්යයන් දෙකක් ලියන්න.
98. දේශපාලන මතවාදයක් යන්න අර්ථ දක්වන්න.
99. දේශපාලන මත වාදවලට අනුකූලව ගොඩනැගි ඇති දේශපාලන ආයතන දෙකක් දක්වන්න.
100. දේශපාලන අධ්‍යයනය සඳහා මුලින් ම යොදාගත් දීර්ඝකාලීන පැවැත්මක් ඇති (සම්භාවය) අධ්‍යයන ප්‍රවේශ දෙකක් දක්වන්න.
101. දාර්ශනික ප්‍රතිමානිය ප්‍රවේශ දේශපාලන අධ්‍යයනය සඳහා යොදගත් , ඊට පුරෝගාමී වූ දේශපාන චින්තකයින් දෙදෙනා හඳුන්වන්න.
102. දාර්ශනික ප්‍රතිමානිය ප්‍රවේශය යොදාගත් දේශපාලන චින්තකයන්ගේ දර්ශනයන් හි විවිධ වෙනස්කම් තිබුණ ද ඔවුන්ට පොදු වූ කරුනු දෙකක් හඳුනාගත හැකි ය. එම කරුණු දෙක දක්වන්න.
103. දර්ශනවාදි ප්‍රවේශය මූලික ලක්ෂණයක් වන්නේ ලෝකය පිළිබඳ ඇති මූලික ප්‍රශ්න ඇසීම සහ විභාග කිරීම ය. ඒ අනුව දේශපාලනය සම්බන්ධව දේශපාලන දර්ශනවාදීන් විභාග කරන ඇති මූලික ප්‍රශ්නවලට උදාහරණ දෙකක් සපයන්න.
104. ලෝකය වඩාත් හොඳ ස්ථානයක් ලෙසට සකස් කළ යුත්තේ කෙසේදැයි අපට සිතන්නට අනුබල දෙන්නේ ප්‍රතිමානීය අරමුණු විසිනි. එයට උදාහරණ දෙකක් සපයන්න.
105. පහත නම් සඳහන් දෙදෙනා තුලනාත්මක දේශපාලන සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කෘතිවල නම් සඳහන් කරන්න.

    1. ග්‍රේබියෙල් ඒ ආමන්ඩ් 2. සැමුවෙල් පී. හන්ටින්ට්

106. බහු විෂයික ප්‍රවේශය තුළින් දේශපාලන විද්‍යාව පෝෂණය ලබා ඇති අතර පහත සඳහන් යුගවල දී දේශපාලන අධ්‍යයනයට එමගින් දායක වූ විෂයන් නම් කරන්න.

107. 1. ග්‍රීක යුගය 2. 19 වන සියවස

108. චර්යවාදී ප්‍රවේශයේ ප්‍රධාන මූලධර්ම දෙකක් දක්වන්න.

109. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ඇති කර ගැනීමේ අරමුණු කුමක් ද ?

110. සන්ධීය, ආණ්ඩු ක්‍රමයක ලක්‍ෂණ හතරක් හඳුන්වා දෙන්න.

111. 1. අර්ථ සන්ධීය ආණ්ඩු ක්‍රමයක් යන්න හඳුන්වා දෙන්න.

112. ඉන්දියාව අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස සලකන්නේ ඇයි ?

113. සහසන්ධීය ආණ්ඩු ක්‍රමයක් යන්න හඳුන්වා දෙන්න.

114. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ලක්‍ෂණ තුනක් දක්වන්න.

115. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්‍ෂණ හතරක් දක්වන්න.

116. මිශ්‍ර ආණ්ඩු ක්‍රමය යන්න අර්ථ දක්වන්න.

117. මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක වඩාත් බහුල සහ ජනප්‍රිය මිශ්‍ර ආණ්ඩු ක්‍රම ස්වරූපය දක්වන්න.

118. 1. අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ තුනක් දක්වන්න.
   2. අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වීමේ දී මතුවන ගැටලු කෙටියෙන් විස්තර කරන්න.
   3. මිශ්‍ර විධායකය ක්‍රියාත්මක කරන රටාවලට උදාහරණ සපයන්න.

119. 1. ඒක තන්ත්‍ර ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ පෙන්වා දෙන්න.
   2. ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රම ස්වරූප ක්‍රියාත්මක වන ස්වරූප හඳුන්වා දෙන්න.

120. ලිබරල් දේශපාලන දර්ශනය සහ ආර්ථික න්‍යාය තුළ ''නිදහස'' යන අර්ථ ගන්වන්නේ කෙසේ ද ?

121. ලිබර්වා දී සංකල්පය තුළ නිදහස යන්නට දි ඇති

122. 1. දාර්ශනික ඇඟවීම
   2. දේශපාලනික ඇඟවීම යන්න අර්ථ දක්වනන්.ත

123. 1. ලිබරල් දේශපාලන මතවාදී අදහස් ඉදිරිපත් කළ ප්‍රධාන දේශපාලන චින්තකයින් හතර දෙනෙක් නම් කරන්න.
   2. ලිබරල්වාදී දේශපාලන අදහස ඉදිරිපත් කළ ඉහත සඳහන් චින්තකයින්ගේ ප්‍රධාන කෘති / රචනා නම් කරන්න.

124. 19 වන සියවසේ යුරෝපයේ මතු වූ දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදය බිහි වීමට පදනම් වූ හේතු කවරේ ද ?

125. සමාජවාදී අදහස් ඉස්මතු වන ප්‍රධාන අවධි දෙකක් හඳුනා ගත හැකි ය. එම අවධි දෙක කෙටියෙන් දක්වන්න.

126. සමූහාණ්ඩුවාදි අදහස් වර්ධනය වූ ප්‍රධාන අවධි හතරක් හඳුනා ගත හැකි. එම අවධි හතර සහ එම අවධි තුළ සමූහාණ්ඩුවාදය වර්ධනය කිරමට දායකත්වය සැපයූ දේශපාලන චින්තකයින් හඳුන්වා දෙන්න.

127. සමූහාණ්ඩුවාදය තුළ දැකිය හැකි පොදු මූල ධර්ම පහක් දක්වන්න.

128. 1. ලිබර්වාදිය හා සමූහාණ්ඩුවාදය එකනෙකින් වෙනස් වන ප්‍රධානලක්ෂණ දෙක දක්වන්න.
   2. පහත සඳහන් ලක්ෂණ දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.

i. ලිබර්වාදය තුළ පුරවැසියා දේශපාලනයට සම්බන්ධ වන ආකාරය
ii. සමූහාණ්ඩුවාදය තුළ පුරවැසියා දේශපාලන සම්බන්ධ වන ආකාරය
iii. ලිබර්වාදය සහ සමූහාණ්ඩුවාදය මගින් ''නිදහස'' යන සංකල්පය අර්ථ දක්වන්නේ කෙසේද?

129. යුරෝපීය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයේ ප්‍රධානතම ලක්ෂණ පෙන්වා දෙන්න.
130. සමාජ ප්‍රජාතන්ත්‍රවාදි ව්‍යාපාරයට මතවාද නැඹුරුවක් සහ අනන්‍යතාවයක් ලැබීමට හේතු සාධක කෙටියෙන් දක්වන්න.
131. දේශපාලන චින්තනයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන මූලධර්ම තුනක් ඉදිරිපත් කරන්න.
132. ''ගැටුමක්'' යන්න අර්ථ දක්වන්න.
133. ගැටුම්වල කාර්ය පිළිබඳ ව දැකි ය හැකි ප්‍රධාන ප්‍රවේශ දෙක දක්වන්න.
134. 1904 ජෝර්ජ් සිමෙන් නැමති සමාජ විද්‍යාඥයා ලියූ ගැටුමේ සමාජ විද්‍යාව නැමැති ග්‍රන්ථයට අනුව ගැටුම්වල සාධනීය කාර්යයන් හතරක් හඳුන්වා දෙන්න.
135. 1956 දි ලුවිස් කේසර් යන සමාජ විද්‍යාඥයා ලියූ සමාජ ගැටුමේ කාර්යය යනකෘතියට අනුව දක්වා ඇති ගැටුමේ සාධනීය ප්‍රතිඵල තුනක් දක්වන්න.
136. ගැටුම්වල නිෂේධනිය පැතිකඩවලට උදාහරණ පහක් දක්වන්න.
137. ගැටුම් ආකාර තුනකින් වර්ගීකරණය කළ හැක. එම ආකාර තුන දක්වන්න.
138. සරල වර්ගීකරණයට අයත් ගැටුම්වල ආකාර හතරක් පහත දක්වා ඇත. එම ආකාර හතර කෙටියෙන් හඳුන්වන්න.
    1. පුද්ගලාභ්‍යන්තර ගැටුම්
    2. අන්තර් පුද්ගල ගැටුම්
    3. කණ්ඩායම් ඇතුළත ගැටුම්
    4. අන්තර් කණ්ඩායම් ගැටුම්
139. 1. කෘත්‍යවාදි වර්ගීකරණය යන පදනම මත ගැටුම් කාණ්ඩ දෙකකට බෙදිය හැකි ය. එම කාණ්ඩ දෙක නම් කරන්න.
    2. එම ගැටුම් කාණ්ඩ දෙක ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා නම් කරන්න.
    3. සාධනීය ගැටුම් සහ නිෂේධනීය ගැටුම් අතර වෙනස පැහැදිලි කරන්න.
140. ගැටුම්වල දේශපාලන වර්ගීකරණයට අනුව මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් ගැටුම්වල ස්වභාවය තුන් ආකාරයට වර්ගීකරණය කර ඇත. එය දක්වන්න.
141. අන්තර් ජාතික දේශපාලන තුළ අන්තර් රාජ්‍ය ගැටුම් ඇති වීමට බලපාන සාධක දෙකක් දක්වන්න.
142. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීම කෙරෙහි බලපාන සාධක හඳුන්වන්න.
143. මහාචාර්ය ලුවිස් ක්‍රිස්බර්ග් විසින් ඉදිරිපත් කළ ගැටුමේ ජීවන චක්‍රයට පදනම් වී ඇති ගැටුමක අවධි හඳුන්වා දෙන්න.
144. ගැටුමේ ජීවන චක්‍රය තුළ ඇති එක් අවධියක් වන ගැටුම් උත්සන්න විම සහ ඒ මගින් ඇතිවන ප්‍රතිඵල තුනක් දක්වන්න.
145. ගැටුමේ උත්සන්නතාව අඩුවීම කෙරෙහි බලපාන හේතු කිහිපයක් දක්වන්න.

146. ගැටුම්වල ජීවනචක්‍රය තුළ අන්තර්ගත ''අන්‍යෝන්‍ය වශයෙන් රිදෙන හිරවීම'' යන සංකල්පයක මගින් අදහස් කරන්නේ කුමක් ද?
147. අන්‍යෝන්‍ය වශයෙන් රිදෙන හිරවීම තුළ ඇතිවන ප්‍රතිඵල ලෙස විලියම් ජ් සාර්ට්මන් ඉදිරිපත් කරන හේතු මොනවාද ?
148. ''සාම ගිවිසුමක් '' මගින් සිදු කරන ක්‍රියාවලිය කුමක් ද ?
149. ගැටුම් නිරාකරණය සඳහා ඉදිරිපත් වී තිබෙන ගැටුම් සමථන ප්‍රවේශයන් හඳුන්වා දෙන්න.
150. ගැටුම් සමථන ක්‍රියාවලිය මගින් නිරීක්ෂණයකළ හැකි කරුණක් වන්නේ ගැටුමක් සම්පූර්ණ ලෙස විසඳීමට දුෂ්කර වුවත් ගැටුමට සාධනීය ලෙස ප්‍රවේශ වීමේ පවතින බව ය. එම මාධ්‍යයන් හඳුන්වා දෙන්න.
151. මැදිහත්කරණය යන්න අර්ථ දක්වන්න
152. මැදිහත්කරණය ක්‍රියාවලි සිදුකරන අවධි හඳුන්වා දෙන්න.
153. ''සාම ගිවිසුම'' යන අදහස පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
154. සාම ගිවිසුමක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පහක් දක්වන්න.
155. ''සාමය ගොඩනැගීම'' සම්බන්ධයෙන් ඉදිරිපත් වි ඇති නිර්වචනය සහ ඒවා ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් නම් කරන්න.
156. ප්‍රතිසන්ධාන ගත වීම යන්නෙහි සරල අර්ථ දක්වන්න.
157. ප්‍රතිසන්ධාන ගත වීම මට්ටම් තුනකින් සිදුවීම් අවශ්‍ය වේ. එම මට්ටම තුන හඳුන්වා දෙන්න.
158. ග්‍රීක භාෂාවේ එන පහත සඳහන් වචන දෙක අර්ථ ගන්වන්න.
159. ඇරිස්ටෝටල් දේශපාලනය නම් කෘතිය තුල ''සක්‍රීය පුරවැසියා'' යන සංකල්පය භාවිතා කිරීමට පදනම් වු හේතු දෙකක් ඉදිරිපත් කරන්න.
160. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක පැවැත්ම සඳහා ඒවාට හැඩගැසුණු භාවිත ගණනාවක් පවතී. ඉන් දෙකක් දක්වන්න.
161. තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ධාර තුනක් හඳුනාගත හැකි ය ඉන් දෙකක් නම් කරන්න.
162. බහු විෂයික යන සංකල්පය තුළ අර්ථ තුනක් හඳුනාගත හැකි ය. ඉන් අර්ථ දෙකක් කෙටියෙන් දක්වන්න.
163. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය හඳුන්වා දුන් ප්‍රධාන චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.
164. දේශපාලන දර්ශනවාදීන් උනන්දුව දක්වා ඇති තේමා දෙකක් පහත දක්වේ. එම තේමාවන් ඉදිරිපත් කළ මධ්‍ය කාලීන දේශපාලන දාර්ශනිකයින් දෙදෙනෙක් සහ සමකාලීන දේශපාලනයට දෙදෙනෙක් දක්වන්න.
    1. යුක්තිය / සාධාරණත්වය
    2. මධ්‍යකාලීන
    3. සමකාලීන
165. ලෝක දේශපාලනයෙහි ලා විශාල කාර්යභාරයක් ඉටු කළ දේශපාලන මතවාද දෙකක් දක්වන්න.
166. සාමජයේ පවත්නා  ආයතන විධිමත් සහ අවිධිමත් ලෙස වර්ගීකරණය කළ හැකි ය. ඒවාට උදාහරණ දෙක බැගින් සපයන්න.
167. 1. විධිමත් ආයතන

2. අවිධිමත් ආයතන

168. යුරෝපය සහ ඇමරිකාව තුළ දේශපාලන පක්ෂ වල කාර්යභාරය තහවුරු වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක දෙක දක්වන්න.

169. බලපෑම් කණ්ඩායම් සහ අභිලාෂ කණ්ඩායම් යන්න අර්ථ දක්වන්න.

170. සමකාලීන ලෝකයේ රාජ්‍යාන්හි කාර්යභාර්ය අතරින් දෙකක් සඳහන් කරන්න.

171. රාජ්‍ය මනුෂ්‍ය සංවිධාන අතර ඉහළ ම සංවිධානය වන්නේය යන ප්‍රකාශය පිළිබඳ අහස් ඉදිරපත් කළ ප්‍රධාන දේශපාලන චින්තකයින් දෙදෙනා නම් කරන්න.

172. නූතන ජාතික රාජ්‍ය යන අදහස මූලික සංකල්ප දෙකක් මත ගොඩනැගී තිබේ . එම සංකල්ප දෙක සඳහන් කරන්න.

173. ජාතික රාජ්‍ය කෙරෙහි ගෝලීයකරණයෙහි බලපෑම පිළිබඳ ව න්‍යායික ප්‍රවේශ දෙකක් ඉදිරිපත් වී තිබේ. එම ප්‍රවේශ දෙක දක්වන්න.

174. නියෝජන ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මූලික සමාජ, දේශපාලන විචල්‍යයන් දෙකක් දක්වන්න.

175. ෆැසිට්වාදයේ ප්‍රධාන ම දේශපාලන නායකයන් දෙදෙනා සහ ඔවුන් ෆැස්ට්වාදය ක්‍රියාත්මක කළ රටවල් දෙක නම් කරන්න.

176. වර්තමානයේ දී රාජ්‍යය හා පුරවැසියා අතර සම්බන්ධතාවයේ කැපී පෙනෙන ලක්‍ෂණ දෙකක් තිබේ. එම ලක්‍ෂණ දෙක සඳහන් කරන්න.

177. සමාජ සම්මුතිවාදය ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

178. ලිබරල්වාදය ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනා ගැනීමට හැකි අතර එයින් ප්‍රභේද දෙකක් දක්වන්න.

179. පූර්ව යටත් විජිත ශ්‍රී ලාංකික සාමාජයේ දක්නට තිබූ ප්‍රධාන ලක්ෂණ පහක් දක්වන්න.

180. බ්‍රිත්‍යන්‍යයන් විසින් ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පැවති රාජකාරි ක්‍රමය බිඳ දැමමට හේතු වූ කරුණු කෙටියෙන් දක්වන්න.

181. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය යටතේ රාජකාරී ක්‍රමය අහෝසි කොට හඳුන්වා දුන් නවක්‍රමවේදය කුමක් ද ?

182. ලංකාව තුළ වැවිලි ආර්ථිකය දිරිමත් කිරීම සඳහා ඉංග්‍රීසින් ගත් පියවරයන් මොනවා ද ?

183. වතු වැවිලි ක්‍රමය ආරම්භවීමත් සමගම ලංකාව තුළ ද්විත්ව ආර්ථිකයක් බිහිවිය. එම ද්විත්ව ක්‍රම දෙක හඳුන්වන්න.

184. වාණිජ කෘෂි කර්මාන්තය තුළින් ලංකාව තුළ සිදු වූ ප්‍රතිඵල කෙටියෙන් දක්වන්න.

185. යුරෝපීය යටත් විජිතවාදීන්ගේ පැමිණීමත් සමග ලංකාව තුළ නිර්මාණය වූ සමාජ ප්‍රශ්න දෙක හඳුන්වන්න.

186. ලංකාවේ බිහි වූ සමාජ දෙක වෙනස් කිරීමට බ්‍රිතාන්‍යයන් ගත් පියවර හයක් දක්වන්න.

187. යටත් විජිත කාරක රාජ්‍ය ලංකාවේ හඳුන්වා දුන් ආර්ථික හා සමාජ පරිවර්තන තල දෙකක් ඔස්සේ ක්‍රියාත්මක විය. එම තල දෙක දක්වන්න.

188. යටත් විජිත කාරක රාජ්‍ය යටත් විජිතය තමන් යටතට නතු කර ගැනීමෙන් පසු බලාපොරොත්තු වූයේ කුමක් ද ?

189. යටත් විජිත ධනවාදයේ ආරම්භය සහ ව්‍යාප්තිය සමඟ ලංකාවේ ඇති වූ ආර්ථික සහ සමාජ ප්‍රථිඵල පෙන්වා දෙන්න.
190. සොල්බරි ව්‍යවස්ථාව වෙස්මිනිස්ටර් අනුව සකස් කරන ලද බ්‍රිත්‍යාන්‍ය ආණ්ඩු ක්‍රමයේ ලක්‍ෂණ සහිත ආණ්ඩු ක්‍රමයකි. එහි ලක්‍ෂණ පහක් පෙන්වා දෙන්න.
191. සෝල්බරි ආණ්ඩු ක්‍රමය බ්‍රිත්‍යානයය ආණ්ඩු ක්‍රමයෙන් වෙනස් කරන ලද අංග මොනවාද යන්න පෙන්වා දෙනන්.
192. සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සකස් වූයේ ආයතනය තුනක එකතුවකිනි. එම ආයතන තුන නම් කරන්න.
193. සොල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යටතේ නියෝජිත මන්ත්‍රි මණ්ඩලයේ සහ සෙනෙට් සභාවේ සංයුතිය සකස් වූ ආකාරය දක්වන්න.
194. සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සඳහා සෝල්බරි ව්‍යවස්ථාවෙන් ඇති කළ විධි විධාන කෙටියෙන් දක්වන්න.
195. සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට ලංකාවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට පසුබිම් වූ ප්‍රධාන හේතු පෙන්වා දෙන්න.
196. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව තුළ අන්තර්ගත ප්‍රධාන ලක්ෂණ පහක් හඳුන්වන්න.
197. 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ තත්ත්වය කෙටියෙන් දක්වන්න.
198. 1972 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් හඳුන්වා දෙන්න.
199. 1972 ව්‍යවස්ථාවේ හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුළත් දුර්වලතා පෙන්වා දෙන්න.
200. දේශපාලන දර්ශනවාදයේ ප්‍රතිමානීය සංකල්පය තරමක් ඉහළ මට්ටමේ අර්ථ දෙකක් දැක්වීම සඳහා භාවිතා කෙරෙයි.
201. දේශපාලන පක්ෂ වර්ගීකරණය අතරින් දෙකක් දක්වන්න.
202. 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ තත්ත්වය කෙටියෙන් දක්වන්න.
203. 1972 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් හඳුන්වා දෙන්න.
204. 1972 ව්‍යවස්ථාවේ හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුළත් දුර්වලතා පෙන්වා දෙන්න.
205. දේශපාලන දර්ශනවාදයේ ප්‍රතිමානීය සංකල්පය තරමක් ඉහළ මට්ටමේ අර්ථ දෙකක් දැක්වීම සඳහා භාවිතා කෙරෙයි.
206. දේශපාලන පක්ෂ වර්ගීකරණය අතරින් දෙකක් දක්වනන්.
207. 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ තත්ත්වය කෙටියෙන් දක්වන්න.
208. 1972 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් හඳුන්වා දෙන්න.
209. 1972 ව්‍යවස්ථාවේ හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුළත් දුර්වලතා පෙන්වා දෙන්න.
210. නූතන භෞමික රාජ්‍යය සංවිධානගත කොට තිබෙන ප්‍රධාන අංග දෙකක් දක්වන්න.
211. පැසිස්ට්වාදය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වූ රාජ්‍යයන් දෙක, බිහි වූ වර්ෂ සහ එහි ප්‍රධාන නායකයන් දෙදෙනා නම් කරන්න.

1. රාජ්‍යයන් දෙක සහ වර්ෂය
2. බිහි කිරීමට මුල් වූ නායකයින් දෙදෙනා

212. ස්වාධිපත්‍යය ප්‍රධාන පැතිකඩ දෙකකින් යුක්ත ය. එම පැතිකඩ දෙක දක්වන්න.
213. වර්තමානයේ දී රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධතාවයේ කැපිපෙනන ලක්ෂණ දෙකක් තිබේ. එම ලක්ෂණ දෙක හඳුන්වන්න.
214. පාලන තන්ත්‍රය ( Regime) යන පදය භාවිතා කරන ආකාරය දක්වා එයට උදාහරණ දෙකක් සපයන්න.
215. රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම පදනම් කොට ගොඩනැගී ඇති ආණ්ඩු ක්‍රම දෙකක් දක්වන්න.
216. ඒකීය ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.
217. ඒකීය ආණ්ඩු ක්‍රමයක පරිපාලන බලතල බෙදාහරින ආකාර දෙකක් දක්වන්න.
218. සන්ධීය ආණ්ඩු ක්‍රමය මට්ටම් දෙකක ආණ්ඩු ක්‍රම ආකෘතියකි. එම මට්ටම දෙක දක්වන්න.
219. සන්දීය ආණ්ඩු ක්‍රමයක් ගොඩනගා ගැනීමට මුල් වූ ප්‍රධාන හේතු දෙකක් දක්වන්න.
220. ලෝක ඉතිහාසය තුල යටත් විජිත බිහි වූ ආකාර දෙකක් දක්වන්න.
221. යටත් විජිත ආර්ථික ක්‍රමයක් සමග ලංකාව තුළ ද්විත්ව ආර්ථික ක්‍රමයක් ඇති විය එම ක්‍රම දෙක නම් කරන්න.
222. යටත් විජිත රාජ්‍ය ලංකාවට හඳුන්වා දුන් ආර්ථික සහ සමාජ පරිවර්තනය ක්‍රම දෙකක් යටතේ සිදු විය. එම ක්‍රම දෙක දක්වන්න.
223. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගින් ආණ්ඩුකාරවරයාගේ බලතල සීමාකරමින් ඇතිකළ ප්‍රධාන දේශපාලන ආයතන දෙක නම් කරන්න.
224. 1910 සහ 1920 ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ව්‍යවස්ථාදායකය තුළ ඇති කළ වෙනස්කම් දෙක දක්වන්න.
225. 1931 ඩොනෙමෝර් ආණ්ඩු ක්‍රමය ප්‍රතිසංස්කරණය තුළින් ව්‍යවස්ථාදායක සම්බන්ධයෙන් ඇති කළ වෙනස්කම් දෙකක් දක්වන්න.
226. ඩොනමෝර් ආණ්ඩු ක්‍රම යටතේ සර්ව ජන ඡන්ද බලය හේතුවෙන් සමාජය තුළ ඇති වූ වෙනස්කම් දෙකක් දක්වන්න.
227. ඩොනමෝර් ආණ්ඩු යුගය තුළ ලංකාවේ ඇති වූ සිවිල් සමාජ ව්‍යාපාර දෙකක් හඳුන්වන්න.
228. දේශපාලන සත්වයෙකු ලෙස පුරවැසියාට නූතන ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු ක්‍රමවල ඉටුකල හැකි කාර්යයන් දෙකක් ලියන්න.
229. ආණ්ඩුකරණ ක්‍රියාවලියක අදාල කාර්යයක් වන්නේ නීති සම්පාදනයයි. නීති සම්පාදනය කිරීමෙන් බලාපොරොත්තු වන අරමුණු දෙකක් ලියන්න.
230. 20 වන සියවසේ තුලනාත්මක දේශපාලන වර්ධනය කිරීමට දායක වූ දේශපාලන චින්තකයින් දෙදෙනෙක් සහ ඔවුන් අදහස් දක් වූ කෘති දෙකක් දක්වන්න.
231.
1. සූරාකෑමෙන් තොර, සමාජයේ පන්ති විභේදනයක් නැති සමානාත්මකවාදී සමාජයක් ගොඩනැගීම.
2. රාජ්‍යයේ උත්තරීතර භාවය, ශ්‍රේෂ්ඨත්වය, අසහාය බව, රණවාදය ප්‍රධාන තැනක් ගැනීම

ඉහත සඳහන් පාඨ දෙක හැඟවෙන රාජ්‍ය මාදිලි දෙක නම් කරන්න.

232. ලිබරල් දේශපාලන මතවාදය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ රූසෝ ඒ සඳහා සංකල්ප දෙකක් ඉදිරිපත් කරන ලදී. එම සංකල්ප දෙක හඳුන්වන්න.

233. දේශපාලන පක්ෂවලට අයත් කාර්යයන් දෙකක්ලියන්න.

234. ස්ත්‍රීවාදයේ ප්‍රධාන ගුරු කුල දක්වන්න.

235. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හදිසි අවස්ථා වර්ග තුනක් සඳහන් කර තිබේ. ඉන් දෙකක් දක්වන්න.

236. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකය සහ නාමික විධායකය යන නිලතල දරන්නේ කවුරුන්ද

1. දේශපාලන විධායකය
2. නාමික විධායකය

237. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක සංවරණ සහ තුලන මගින් විධායක බලතල වලින් ව්‍යවස්ථාදායක බලතල වෙන්කර තිබේ. එයට බලපෑ ප්‍රධාන හේතු දෙක කවරේ ද ?

238. අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.

239. ලිබරල්වාදය සහ සමූහාණ්ඩුවාදය එකිනෙකින් වෙනස් කරන ලක්ෂණ දෙක දක්වන්න.

240. ජාතිකවාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් ඔස්සේ හඳුනාගත හැකිය. ඉන් දෙකක් ලියන්න.

241. ගැටුම්වල කාර්ය ප්‍රධාන ප්‍රවේශ දෙකක් ඔස්සේ හඳුනාගත හැකිය. ඉන් දෙකක් ලියන්න.

242. සාමය ගොඩනැගීමේ බ්‍රිතාන්‍ය වෙස්මිනිස්ටර් ආණ්ඩු ක්‍රමයෙන් වෙනස් වූ අංග දෙකක් දක්වන්න.

243. සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සකස් වුයේ ආයතන තුන එකතුවෙනි. මින් දෙකක් නම් කරන්න.

244. සුළු ජන අයිතාවාසිකම් ආරක්ෂා කිරිම සඳහා සෝලබරි ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ආරක්ෂණ විධි විධාන දෙකක් දක්වන්න.

245. සෝල්බරි ව්‍යවස්ථාව තුළින් රාජ්‍ය සේවාකොමිසම පත් කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

246. ලංකාවේ පැවති පූර්ව පක්ෂ දේශපාලන සංවිධාන දෙකක් ලියා දක්වන්න.

247. ලංකාවේ දේශපාලන පක්ෂ බිහි වීමට අවශ්‍ය පසුබිමේ පැවති ප්‍රධාන සාධක දෙක ලියා දක්වන්න.

248. ලංකාවේ ප්‍රථමයෙන් බිහි වූ දේශපාලන පක්ෂ දෙක නම් කරන්න.

249. නියෝජන දේශපාලන වර්ගීකරණයට අයත් පක්ෂ බිහිවීම ආරම්භ වන්නේ කුමන කාලයේද යන්න දක්වා එසේ බිහි වූ වාර්ගික සංවිධාන 2ක් ලියා දක්වන්න.

250. එජාපය බිහි වීමට බලපෑ සාධක 2ක් ලියා දක්වන්න.

251. එජාපය හා ශ්‍රීලනිප දෘෂ්ඨිවාදය ලියා දක්වන්න.

252. ලංකාවේ දූනට පවතින දේශපාලන පක්ෂ 2 ක දක්වන්න.

253. ලංකාවේ වමේ ව්‍යාපාරයේ ප්‍රධාන ධාරාවන් 2ක් දක්වා එම ධාරාවන් දෙකේ ප්‍රධාන ප්‍රතිපත්තිද ලියා දක්වන්න.

254. වාමාංශික පක්ෂ අතරින් ප්‍රධානම බලවේගය නම් කර එම බලවේගය අනෙක් බලවේගයන්ට වඩා විශේෂ වන සාධක දෙකක් ලියා දක්වන්න.

255. ජනවාර්ගික පක්ෂයක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

256. ලංකාවේ පවතින වාර්ගික ස්වභාවයක් ගන්නා පක්ෂ බිහි වන්නේ කුමන වකවානුවෙන් පසුවද යන්න දක්වා එසේ වාර්ගිකව බිහි වූ දේශපාලන පක්ෂ 4ක් දක්වන්න.
257. දෙමළ ජනතාවට වැඩිම බලපෑමක් සිදු කළ දේශපාලන ව්‍යාපාරය කුමක්ද? එය අසාර්ථක දේශපාලන ව්‍යාපාරයක් වීමට බලපෑ කරුණු 2ක් ලියා දක්වන්න.
258. ලංකාවේ පාර්ලිමේන්තු දේශපාලන ක්‍රමයේ ප්‍රධානතම ලක්ෂණය කුමක්ද යන්න දක්වා සභාය ආණ්ඩුවක් යන්න අර්ථකථනය කරන්න.
259. සභාය ආණ්ඩු පිහිටුවීමට බලපාන සාධක දෙකක් ලියා දක්වන්න.
260. ලංකාවේ ලියාපදිංචි නොවූ අභාගයට ගිය දේශපාලන පක්ෂ කීයක් තිබේද? 4ක් ලියන්න.
261. ලංකාවේ ලියාපදිංචිව සිට අභාවයට ගිය දේශපාලන පක්ෂ කොපමණ තිබේද? ඉන් 4ක් ලියන්න.
262. ලංකාවේ දේශපාලන පක්ෂ හතු පිපෙන්නාක් මෙන් බිහිව ඉතා ඉක්මණින් අභාවයට යෑමට හේතු දෙකක් ලියන්න.
263. ජාත්‍යන්තර දේශපාලනය යනු කුමක්දැයි සරලව දක්වා ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවන් 04ක් ලියා දක්වන්න.
264. ජාතික දේශපාලනයෙන් ජාත්‍යන්තර දේශපාලනය ඔබ වෙන් කර දක්වන්නේ කෙසේද?
265. ජාතික දේශපාලනය යනු කුමක්ද යන්න දක්වා ජාතික දේශපාලනයේ වැදගත් මාතෘකා 02ක් ලියන්න.
266. ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයෝ වර්ග 02 කි. එම වර්ග 02 ලියා දක්වන්න.
267. ජාත්‍යන්තර දේශපාලනයේ දී අධ්‍යයනය කරණු ලබන වැදගත් මාතෘකා 04ක් ලියා දක්වන්න.
268. අන්තර් රාජ්‍ය සංවිධානයක් යනු කුමක්ද යන්න දක්වා එම සංවිධාන 02ක් දක්වන්න.
269. වර්තමානයේ පවතින බහු ජාතික සමාගම් 04 ක් දක්වන්න.
270. කුමක්දැයි කෙටියෙන් දක්වන්න.
271. අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන යනු මොනවාද?
272. රාජ්‍ය නොවන සංවිධානවලට උදාහරණ 04ක් ලියා දක්වන්න.
273. බහු ජාතික සමාගමක් යනු කුමක්ද?
274. ප්‍රංශයේ මධ්‍යගතභාවය සඳහා යොදවාගත් දේශපාලන හා පරිපාලන ආයතන දෙකකි.
    දේශපාලන ආයතනය
    පරිපාලන ආයතනය
275. ප්‍රංශ දේශපාලන විධායකයේ ප්‍රධාන අංශ දෙක කුමක්ද?
276. ප්‍රංශයේ බලය විමධ්‍යගත කළ ප්‍රධාන භූගෝලීය කලාප දෙක කුමක්ද?
277. කලාප සභා නියෝජිත කණ්ඩායම් තුනකින් යුක්ත වෙයි. ඒවායින් දෙකක් දක්වන්න.
278. ප්‍රංශ ප්‍රාදේශීය පරිපාලනයේ තීන්දු ගැනීමට සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය ආයතන බලධාරීන් වර්ග දෙකකි. ඒ දෙක දක්වන්න.
279. කොමියුන් විසින් ඉෂ්ඨ කරන ප්‍රධාන කාර්යයන් දෙකක් දක්වන්න.
280. ප්‍රංශයේ මධ්‍යගත පාලනයට විරුද්ධ විවේචන දෙකක් දක්වන්න.
281. 1978 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධානතම ලක්‍ෂණය කුමක්ද?

282. ජනාධිපතිවරයාගේ තත්වය විස්තර කර ඇත්තේ කුමන වගන්තියෙන්ද දක්වා එහි පවතින විධිවිධාන දක්වන්න.
283. 1978 ව්‍යවස්ථාවේ අගමැතිවරයා පිළිබඳව යම් විශේෂත්වයක් දැක්වූයේ කරුණු 4ක් සම්බන්ධයෙනි. ඒවායින් 2ක් ලියන්න.
284. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග ගණනකාවකි. ඒවායින් දෙකක් දක්වන්න.
285. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ආයතන ගොඩනැංවීමට යොදාගත් ප්‍රධාන දේශපාලන සංකල්ප දෙකක් දක්වන්න.
286. බ්‍රිතාන්‍යයේ ජාතික ආගමික වාර්ගික අනන්‍යතා ගණනාවකි. ඒවායින් දෙකක් දක්වන්න.
287. ස්කොට්ලන්තයේ හා වේල්සයේ ප්‍රාදේශීය පාලනය ක්‍රියාවට නැංවීමට හඳුන්වා දී තිබෙන පාලන ඒකකයන් මොනවාද?
    1. ස්කොට්ලන්තයේ
    2. වේල්සයේ
288. උතුරු අයර්ලන්තයේ ආගමික ගැටුම්වල ප්‍රධාන පාර්ශව මොනවාද?
289. ප්‍රංශයේ මධ්‍යගතභාවය සඳහා යොදවාගත් දේශපාලන හා පරිපාලන ආයතන දෙකකි.
    1. දේශපාලන ආයතනය
    2. පරිපාලන ආයතනය
290. ප්‍රංශ දේශපාලන විධායකයේ ප්‍රධාන අංශ දෙක කුමක්ද?
291. ප්‍රංශයේ බලය විමධ්‍යගත කළ ප්‍රධාන භූගෝලීය කලාප දෙක කුමක්ද?
292. කලාප සභා නියෝජිත කණ්ඩායම් තුනකින් යුක්ත වෙයි. ඒවායින් දෙකක් දක්වන්න.
293. ප්‍රංශ ප්‍රාදේශීය පරිපාලනයේ තීන්දු ගැනීමට සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය ආයතන බලධාරීන් වර්ග දෙකකි. ඒ දෙක දක්වන්න.
294. කොමියුන් විසින් ඉෂ්ඨ කරන ප්‍රධාන කාර්යයන් දෙකක් දක්වන්න.
295. ප්‍රංශයේ මධ්‍යගත පාලනයට විරුද්ධ විවේචන දෙකක් දක්වන්න.
296. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධානත ම ලක්ෂණය කුමක්ද?
297. ජනාධිපතිවරයාගේ තත්වය විස්තර කර ඇත්තේ කුමන වගන්තියෙන්ද දක්වා එහි පවතින විධිවිධාන දක්වන්න.
298. 1978 ව්‍යවස්ථාවේ අගමැතිවරයා පිළිබඳ යම් විශේෂත්වයක් දැක්වූයේ කරුණු 4ක් සම්බන්ධයෙනි. ඒවායින් 2ක් ලියන්න.
299. පනත් සම්මත කිරීමේදී
    පාර්ලිමේන්තු අනුමැතියට යටත්වන කෙටුම්පතක් සම්මත කළ යුත්තේ කාගේ අනුමැතියෙන්ද?
300. ජනතා විචාරණයේදී අනුමැතිය ලැබෙන කෙටුම්පතක් නීතියක් වීමට අත්සන් කළ යුත්තේ කවුද?
301. අධිකරණයේ ස්වාධීනත්වය යනු කුමක්ද යන්න දක්වා අධිකරණයේ ස්වාධීනත්වයට අනුගමනය කරන කොන්දේසි 2ක් ලියන්න.
302. අධිකරණයට විනිසුරුවන්ව හිතුවක්කාර අන්දමින් ජනාධිපති තම අභිමතයට පත් කළ බවට උදාහරණ 2ක් ලියන්න.

303. රාජ්‍ය සේවයේ හා අධිකරණයේ ස්වාධීනත්වයට ගොඩනැගූ ආයතන 2ක වෙන වෙනම ලියා දක්වන්න.
304. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් අන්තර්ගත වන්නේ කුමන පරිච්ඡේදයේද? කුමන වගන්තියේද?
305. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රථම වරට හඳුන්වා දෙනු ලැබුවේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?
306. රාජ්‍ය සේවාව දේශපාලන විධායකය යටතට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කරනු ලැබුවේ කුමන ව්‍යවස්ථාව යටතේද?
307. 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නවාංග 4ක් ලියා දක්වන්න.
308. ඔම්බුඩ්ස්මන් අයිති මූලික කාර්ය කුමක්ද? යන්න දක්වා පෙත්සම් අදාළව පරීක්ෂා කරන විට ඔම්බුඩ්ස්මන් අවධානය යොමු කරන කරුණු 2ක් ලියන්න.
309. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පවත්වන නියෝජන ක්‍රමය හා පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන නියෝජන ක්‍රමයක් වෙන වෙනම ලියන්න.
310. මැතිවරණ කොට්ඨාශ බෙදා වෙන් කරන විට ලංකාව මැතිවරණ කොට්ඨාශ කොපමණ ප්‍රමාණයක් ගොඩනැගුවාද? දක්වා මූලික වෙනසකට ලක්වූ කොට්ඨාශ දෙක ලියන්න.
311. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා මැතිවරණ ක්‍රමය යොදා ගැනීමේ අරමුණු 2කි. එය ලියා දක්වන්න.
312. ජනාධිපතිවරයා තෝරා ගැනීමට පත්වන නියෝජන ක්‍රමයේ වාසියක් හා අවාසියක් ලියන්න.
313. ජනමත විචාරණයේදී අනිවාර්ය ජනමත විචාරණය සිදු කිරීමට සිදුවන වගන්ති ලියා දක්වන්න.
314. 17 වන සංශෝධනයෙන් හඳුන්වා දුන් 18 වන සංශෝධනයෙන් අහෝසි කළ ආයතනය හා ඒ වෙනුවට 18 වන සංශෝධනයෙන් ඇති කළ නව ආයතනය කුමක්ද?
315. 18 වන සංශෝධනයෙන් සිදු කරනු ලැබූ මූලික වෙනස්කම් 2ක් ලියා දක්වන්න.
316. 19 වන සංශෝධනයෙන් ජනාධිපති ධූරයේ සිදු වූ වෙනස් වීම් 4ක් ලියා දක්වන්න.
317. 19 වන සංශෝධනයෙන් පාර්ලිමේන්තුවේ සිදුවූ වෙනස්වීම් 2ක් ලියන්න.
318. 19 වන සංශෝධනයෙන් අග්‍රාමාත්‍ය ධූරයේ සිදුවූ වෙනස්කම් 2ක් ලියන්න.
319. 19 වන සංශෝධනයෙන් ජනාධිපතිගේ කාර්යයන් දක්වා ඇත. එහි කාර්යය 2ක් ලියන්න.
320. ප්‍රජාතන්ත්‍රවාදය යනු පාලන ආකෘතියක් පමණක් නොව ජීවන ආකෘතියකි යන නිර්වචනය ඉදිරිපත් කළ දාර්ශනිකයා කවුද?
321. ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද යන්න දක්වා ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම අවශ්‍ය පූර්ව කොන්දේසි ලියා දක්වන්න.
322. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියේ නාභිය වන්නේ කුමක්ද?
323. බහුත්වවාදය යනු කුමක්ද?
324. ප්‍රජා පීඩන බලයලත් සහ අධිකාරියක් නැති මහජනතාවට වගකියන සීමිත බලයක් ඇති ආණ්ඩුව හඳුන්වන්නේ කුමන නමකින්ද?
325. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක් යන්න දක්වා එය ඇතුළත් වන මැතිවරණ ක්‍රමය මගින් ආරක්ෂා කළ යුතු ලක්ෂණ 4ක් ලියන්න.

326. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ලක්ෂණ 4ක් ලියන්න.
327. රාජ්‍යයේ බලයේ මූලාශ්‍රය මහජනතාවයි යන සංකල්පය කුමක්ද යන්න දක්වා එහි ප්‍රධානතම ප්‍රකාශකයා කවුද?
328. බලතල බෙදීමේ න්‍යාය යනු කුමක්ද දක්වා එම න්‍යාය ඉදිරිපත් කළ දාර්ශනිකයන් ලියා දක්වන්න.
329. සංවර්ධන තුලන න්‍යාය කෙටියෙන් දක්වන්න.
330. මානව අයිතිවාසිකම් සරලව හඳුන්වා මානව අයිතිවාසිකම් මුලින්ම අනාවරණය කළ චින්තකයා ලියා දක්වන්න.
331. ප්‍රජාවට වගවීම යන සංකල්පය කෙටියෙන් ලියා දක්වන්න. එහි පවතින මත 2ක් ලියා දක්වන්න.
332. ප්‍රජාවට වගවීම සම්බන්ධයෙන් පවතින යාන්ත්‍රණ 2ක් ලියන්න.
333. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී අංග 4ක් ලියා දක්වන්න.
334. ශ්‍රී ලංකාවේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී නොවන අංග ලක්ෂණ 4ක් දක්වන්න.
335. ශ්‍රී ලංකාවට වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය ගැලපීමට හේතු 2ක් ලියා දක්වන්න.
336. ඇමරිකාවේ ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ 4ක් ලියා දක්වන්න.
337. ඇමරිකාවේ මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට තම තමන්ට අයත් බලතල වෙන් කර තිබුණද ප්‍රාන්ත රාජ්‍ය සම්බන්ධයෙන් මධ්‍යම රජයට පැවරී ඇති බලය කරුණු හතරක් මත රඳා පවතී. ඉන් 2ක් ලියා දක්වන්න.
338. ඇමරිකාවේ මධ්‍ය රජයට අයත් බලතල 2ක් හා ප්‍රාන්ත රජයට අයත් බලතල 2ක් ලියා දක්වන්න.
339. ඇමරිකාවේ ප්‍රාන්ත රාජ්‍යය මත පනවා ඇති සීමාවන් 2ක් ලියන්න.
340. ඇමරිකාවේ මධ්‍යම ආණ්ඩුවේ බලතල පසුගිය කාලාන්තරයන් මුළුල්ලේ වර්ධනය වීමට බලපා ඇති හේතු 2ක් ලියන්න.
341. ඇමරිකානු ආණ්ඩුක්‍රමය සම්භාව්‍ය ෆෙඩරල් ක්‍රමයෙන් වෙනත් දිසාවකට ගමන් කිරීම මෑත කාලීන ප්‍රවණතාවයකි. එයට හේතු 2ක් ලියන්න.
342. ඉන්දියානු ව්‍යවස්ථාවේ ලක්ෂණ 4ක් ලියන්න.
343. ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ විශේෂ ලක්ෂණ 2ක් ලියන්න.
344. පසුගිය දශක හයක පමණ විකාශනය තුළ ඉන්දියානු ෆෙඩරල් ප්‍රවණතාව වඩාත් ශක්තිමත් වී තිබේ. එයට බලපෑ හේතු 2ක් ලියන්න.
345. ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ පදනම ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් පැවතීමයි. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් පවතීමට හේතු 2ක් ලියා දක්වන්න.
346. ඉන්දියානු ආණ්ඩුක්‍රමය ඒකීය වාදී ලක්ෂණ සහිතය. එවැනි ලක්ෂණ 2ක් ලියන්න.
347. ස්විස්ටර්ලන්තයේ ෆෙඩරල් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය කුමක්ද?
348. ස්විස් කැන්ටන ස්වාධිපත්‍යය යනු කුමක්ද?
349. ව්‍යවස්ථාවෙන් කැන්ටන මත පැනවූ සීමාවන් 2ක් ලියන්න.
350. ස්විස්ටර්ලන්තයේ ඇති ප්‍රධානම සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම 2ක් ලියන්න.
351. ස්විස්ටර්ලන්ත ආණ්ඩුවේ පවතින තල 3කි. ඉන් 2ක් ලියන්න.

352. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම ක්‍රියාවලිය ආරම්භ වන්නේ කුමන ව්‍යවස්ථා සංශෝධනයෙන්ද යන්න දක්වා ශ්‍රී ලංකාවේ විමධ්‍යගතකරණයත් සමග ආණ්ඩුක්‍රම මාදිලිය හඳුන්වන්නේ කුමන නමකින්ද?

353. ශ්‍රී ලංකාවේ ඒකීය රාජ්‍ය ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීමට බලපෑ ප්‍රධාන හේතුව ලියා දක්වා එම ගැටලුව අවධි 3කින් හඳුනාගත හැකිය. අවධි 2ක් ලියා දක්වන්න.

354. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර ඇති ලැයිස්තු 2ක් ලියා දක්වන්න.

355. ''රාජ්‍ය ප්‍රතිපත්තිය යනු ආණ්ඩුව කරන්නේ කුමක්ද? ආණ්ඩුව ඉටු කරන්නේ ඇයි හා එයින් වෙනසක් ඇති කෙරේද යන්නයි.'' නිර්වචනය ඉදිරිපත් කළේ කවුද?

356. රාජ්‍ය ප්‍රතිපත්ති සමඟ බැඳුණු සංකල්ප 2ක් ලියන්න.

357. ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ ප්‍රධාන පියවරවල් 2ක් ලියා දක්වන්න.

358. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක ලක්ෂණ ඔබ හඳුනාගන්නේ කෙසේද?

359. ''නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය මැතිවරණ මත පදනම් වේ.'' යන්න පැහැදිලි කරන්න.

360. ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් මිශ්‍ර වූවකි. සාකච්ඡා කරන්න.

361. පහත ආණ්ඩුක්‍රම මාදිලි අතරින් අසා ඇති ප්‍රශ්නවලින් 2ක් තෝරා පිළිතුරු සපයන්න.

## රචනා ප්‍රශ්න

### A කොටස

1. 1978 ව්‍යවස්ථාවට එල්ලව පවතින විවේචන පිළිබඳව විග්‍රහයක් කරන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලින් හතරක් තෝරාගෙන එයට පිළිතුරු සපයන්න.පහත සඳහන් ප්‍රකාශ දෙකකට පිළිතුරු සපයන්න.
   1. දේශපාලන විද්‍යාව යනු කුමක්ද යි හඳුන්වා දෙන්න.
   2. ''දේශපාලනය'' යනු කුමක්ද යි හඳුන්වා දෙන්න.
3. දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය පැහැදිලි කරන්න.
4. ''දේශපාලන විද්‍යාව තුළින් අධ්‍යයනයට ලක් කරන දේශපාලනය යන්න සමාජයේ පැවතීමේ විවිධ පැතිකඩ කිහිපයකි. එම පැතිකඩවල් හඳුනා ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.
5. පහත සඳහන් ප්‍රකාශ අතරින් දෙකක් පැහැදිලි කරන්න.
   1. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශවල වර්ධනය
   2. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය
   3. තුලනාත්මක ප්‍රවේශය
   4. බහු විෂයික ප්‍රවේශය
6. දේශපාලන න්‍යාය තුළ දක්නට ලැබෙන ප්‍රතිමානීය න්‍යාය සහ විද්‍යාත්මක න්‍යාය පැහැදිලි කරන්න.
7. දේශපාලන ආයතන අතර කේන්ද්‍රීය දේශපාලන ආයතන ලෙස රාජ්‍ය සහ ආණ්ඩුව අතර සම්බන්ධතාවය පෙන්වා දෙන්න.
8. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් පැහැදිලි කරන්න.
   1. දේශපාලන පක්ෂ
   2. සිවිල් සමාජය
   3. බලපෑම් කණ්ඩායම්
9. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් සාකච්ඡා කරන්න.
   1. නූතන භෞමික රාජ්‍ය
   2. නූතන ජාතික රාජ්‍ය
   3. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය
10. පහත සඳහන් ප්‍රකාශ දෙක ගැන අදහස් දක්වන්න.
    1. රාජ්‍ය සහ ස්වාධිපත්‍ය
    2. රාජ්‍ය සහ පුරවැසියා
11. පහත සඳහන් රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ න්‍යායික ප්‍රවේශ අතරින් දෙකක් සාකච්ඡා කරන්න.
    1. සමාජ සම්මුතිවාදය
    2. මාක්ස්වාදය
    3. ලිබරල්වාදය
    4. ස්ත්‍රීවාදය

12. පහත සඳහන් ආණ්ඩුක්‍රම ආකෘති අතරින් දෙකක් පිළිබඳ ව අදහස් දක්වන්න.
    1. ඒකීය ආණ්ඩු ක්‍රමය

2. සන්ධීය ආණ්ඩු ක්‍රමය
3. අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමය
4. සහසන්ධීය ක්‍රමය

13. ජනාධිපති ආණ්ඩු ක්‍රමය සහ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.

14. පහත සඳහන් මතවාද අතරින් දෙකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
    1. සමාජවාදය
    2. සමූහාණ්ඩුවාදය
    3. ෆැසිස්ට්වාදය
    4. ජාතිකවාදය

15. දේශපාලන මතවාදයක් ලෙස නිරාගමිකවාදයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

16. ලිබරල්වාදී චින්තනයට දායකත්වය ලබාදුන් පහත සඳහන් දේශපාලන චින්තකයින් අතරින් දෙදෙනෙකුගේ දේශපාලන අදහස් පිලිබඳ විමසීමක් කරන්න.
    1. තෝමස් හොබ්ස්
    2. ජෝන් ලොක්
    3. මොන්ටෙස්ක්‍යු
    4. ෂොන් ෂාක් රූසෝ

17. පහත සඳහන් ප්‍රකාශ දෙකට පිළිතුරු සපයන්න.
    1. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම.
    2. දේශපාලනය සමාජ භාවිතයක් ලෙස

18. රාජ්‍ය පිළිබඳ ව පහත සඳහන් මාතෘකා දෙක සාකච්ඡා කරන්න.
    1. රාජ්‍ය සහ එහි භූමිකාව
    2. සමාජයෙහි පවතින දේශපාලන බලයේ කේන්ද්‍රය ලෙස රාජ්‍යයේ තත්ත්වය

19. පහත සඳහන් ප්‍රකාශවලින් දෙකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
    1. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
    2. ෆැසිස්ට්වාදය
    3. සහසන්ධීය ආණ්ඩුක්‍රමය

20. රාජ්‍ය මාදිලියක් ලෙස ''නව ලිබරල්වාදී රාජ්‍යය'' පිළිබඳ ව පැහැදිලි කිරීමක් කරන්න.

## B කොටස

21. පූර්ව යටත් විජිත ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දෙන්න.

22. රාජකාරී ක්‍රමය අහෝසි කිරීම නිසා ලංකාවේ ඇති වූ ආර්ථික සමාජීය ප්‍රතිඵල විමසන්න.

23. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් ලංකාවට යෝජනා කළ නිර්දේශ සඳහන් කරන්න.

24. 1833 - 1931 දක්වා ලංකාවේ ව්‍යවස්ථාදායක සභා වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

25. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගින් ලංකාව තුළ ඇති කළ දේශපාලන වෙනස්කම් සහ එමගින් ඇති වූ ප්‍රතිඵල සාකච්ඡා කරන්න.

26. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යොදන ලද ආරක්ෂණ විධි විධාන හඳුන්වා දෙන්න.

27. 1978 ව්‍යවස්ථාවේ පහත සංශෝධන අතරින් 2ක් ලියන්න.
    1. 13 වන සංශෝධනය
    2. 17 වන සංශෝධනය
    3. 18 වන සංශෝධනය
    4. වන සංශෝධනය

28. පහත මැතිවරණ ක්‍රම අතරින් 2ක් ලියන්න.
    1. ජනාධිපතිවරණය
    2. ජනමත විචාරණය
    3. පාර්ලිමේන්තු මැතිවරණය

29. 1978 ව්‍යවස්ථාවේ පහත මාතෘකා අතරින් 2ක් ලියන්න.
    1. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය හා භාවිතය
    2. විධායකය හා රාජ්‍ය සේවය
    3. විධායකය සහ බල කේන්ද්‍රය

30. පහත මාතෘකා අතරින් 2ක් ලියන්න.
    1. මූලික අයිතිවාසිකම්
    2. ඔම්බුඩ්ස්මන්වරයා
    3. ශ්‍රේෂ්ඨාධිකරණය

31. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.
    1. ශ්‍රී ලංකාවේ විමධ්‍යගතකරණ ක්‍රියාවලිය
    2. පළාත් සභා හඳුන්වාදීමේ අරමුණු
    3. පළාත් සභා ක්‍රමයේ ලක්ෂණ
    4. පළාත් සභා ක්‍රමයේ වර්තමාන තත්ත්වය

## C කොටස

31. ගැටුම් වර්ගීකරණය තුළ ඇති දේශපාලන වර්ගීකරණය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

32. ''ගැටුම් සමථන මාධ්‍ය'' විස්තර කරන්න.

33. මහා බ්‍රිතාන්‍යයේ ඒකීය ආණ්ඩුක්‍රමය තුළ බලය විමධ්‍යගත කර ඇති ආකාරය විස්තර කරන්න.

34. ප්‍රංශයේ ඒකීයභාවය ශක්තිමත් කළ ප්‍රධාන උපක්‍රම දෙකක් ලෙස පහත ආයතන පිළිබඳව විමසීමක යෙදෙන්න.
    1. ජනාධිපති ධූරය
    2. ප්‍රාදේශීය පාලනය

35. ගැටුම් යන්න අර්ථ දක්වන්න.

36. ගැටුම් සමථන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

37. පහත මාතෘක අතරින් 2ක් තෝරා ලියන්න.
    1. ව්‍යවස්ථානුකූලවාදය
    2. බලතල බෙදීම.
    3. සංවරණ හා තුලන
    4. නීතියේ ආධිපත්‍යය
    5. සීමිත ආණ්ඩුව

foaYmq,k jsHfõkj oSYdk;s

**සුරේන් ඉඳුරුව**